# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1942/15 - 2015 නොවැම්බර් මස 26 වැනි බ්‍රහස්පතින්දා - 2015.11.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78(xiv)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

20(4) වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20(4) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන සහ මහා මාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, ශ්‍රී ලංකාවේ, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ පරිපාලන කටයුතු බරපතල ලෙස අවුල් වී ඇති බවට සහ එම විද්‍යායතනයේ බලධාරීන් විසින් එම විද්‍යායතනයේ කටයුතු යථා තත්ත්වයට ගෙන ඒමට අපොහොසත් වී ඇති බව ද සෑහීමකට පත් වීමෙන් පසු, එකී පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද නියමයක්, නියමාවලියක්, ප්‍රඥප්තියක්, අතුරු ව්‍යවස්ථාවක්, නියෝගයක් හෝ රීතියක් යටතේ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ අධ්‍යක්ෂ වෙත පිරිනමන ලද, පනවන ලද හෝ පවරන ලද පිළිවෙලින් යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ, ඉටු කිරීමේ හෝ කිරීමේ කාර්යය සඳහා එකී ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ අධ්‍යක්ෂ වෙනුවට තිසි බලධරයා වශයෙන් මහාචාර්ය ජයන්ත වැලිහිඳ, 2015 නොවැම්බර් මස 26 වන දින සිට බලපැවැත්වෙන පරිදි මේ නියමය මගින් පත් කරමි.

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍ය.

2015 නොවැම්බර් මස 24 වැනි දින.
කොළඹ දී ය.

12-356